# 02. උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටීම

කඳු පළාත, මැද පළාත හා ගඟ පළාත වශයෙන් වෙන් කෙරෙන උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කඳු සහිත ප්‍රදේශ නිම්න හා මොහොර ලක්ෂණ වලින් සමන්විතය.

*<u>කොට්ඨාශයේ සාපේක්ෂ පිහිටීම -</u>*

- උතුරින් - පේරාදෙණිය කඩුගන්නාව දක්වා මාර්ගය සහිත යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයද
- නැගෙනහිරින් - මහවැලි ගඟෙන් වෙන්වන ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයද
- දකුණින් - උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයද
- බටහිරින් - කෑගල්ලදිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයද පිහිටා ඇත.

*<u>භූවිෂමතාවය -</u>*

උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුහුදු මට්ටමේ සිට ඇති උස සලකා බැලීමේදී ප්‍රධාන වශයෙන් භූවිෂමතා කළාප 03 කට වෙන් කර හඳුනා ගත හැක.

- මුහුදු මට්ටමේ සිට උස මී. 500 – 600 අතර කළාපය
- මුහුදු මට්ටමේ සිට උස මී. 600 – 700 අතර කළාපය
- මුහුදු මට්ටමේ සිට උස මී.700 ට වැඩි කළාපය

*<u>ජලවහනය -</u>*

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බටහිර අර්ධයේ සිට නැගෙනහිර අර්ධය දෙසට එහි මධ්‍යයේ සිට විහිදෙන ස්වභාවික ජලය වහනය වන කුඩා ඇළ මාර්ගය සහ ජල මාතිකා රාශියකි. නැගෙනහිර අර්ධයෙන් මහවැලි ගඟට ගලා බසින ස්වභාවික ජල වහනය වන ප්‍රධාන ඔය ගෙලිඔය වන අතර ප්‍රදේශයෙන් ඉවත් වී මහවැලි ගඟට එක් වේ.මෙම ප්‍රධාන ඔයට ඇල මාර්ග රාශියක් එකතු වේ.

- හොඩියාදෙණිය - ලුණුගම - පල්කුඹුර - දෙහිපාගොඩ හරහා ගලාබසින දෙහිපාගොඩ මැද ඇල
- පිළිගල්ල කඹුරාදෙණිය පල්ලේඅළුදෙණිය ප්‍රදේශ හරහා ගෙලිඔයට සම්බන්ධ වනඇල මාර්ගය
- මධ්‍යම කඳු මිටියාවත් ඔස්සේ වෙලම්බොඩ විහාරගම ගංහත දිහිට්දෙණිය - ඇල්දෙණිය හරහා ගලා බසින උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට යාවන ගල්ගෙඩියා ඔයද තවත් ප්‍රධාන ඇල මාර්ගයකි
.

- යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් ආරම්භ වී නැගෙනහිර දිශාවට ගලා බස්නා නානු ඔයද ප්‍රධාන අතු ගංගාවකි.උඩුනුවර මාම්පිටිය ගංගොඩ බෝයගම වැනි ප්‍රදේශ හරහා මෙයට යාවෙන කුඩා අතු ඇලවල් රාශියකි.
- කිරිවවුල නැගෙනහිර බටහිර - ගඩලාදෙණිය දකුණ හරහා පමුණුව,බෝයගම දක්වා දිවෙන ප්‍රධාන ඇල මැද පළාත ප්රදේශයෙන් නානු ඔයට යාවෙන ජල මාතිකාවකි.

- පාන බොක්ක - වට්ටප්පොල - උඩගම - මාත්ගමුව ග්‍රාමීය කොට්ඨාශ වලින් ඇරඹෙන කුරුකුත්තල - අලදුවක හරහා උතුරු දෙසින් ගලා බස්නා මහ ඇලද නානු ඔයට සම්බන්ධ වන ප්‍රධාන ජල මාර්ගයකි.

- මාවීකුඹුර උතුර - දකුණ  - මාණික්කාව - ඇල්පිටිකන්ද - වෙම්බිලිවත්ත යන ප්‍රදේශය හරහා බටහිර දිශාවෙන් උතුරට මාවනැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ  මහ ඔයට යාවෙන ප්‍රධාන ඇලද උඩුනුවර කඳු පළාත පෝෂණය කරන තවත් ජල ප්‍රවාහයකි.

*<u>පාංශු කළාප-</u>*

- අපරිනත දුඹුරු ලොම් පස - **IBL ( IMMATURE BROWN LOAM SOIL)**

- රතු දුඹුරු ලැටසොලිත පස - **RBL ( REDDISH BROWN LATTESOL)**

- ප්‍රපාතකාර පාෂාණ බිම් ඇති ප්‍රදේශ වල ලිතසොල්ස් පස - **LITHOSOLS AND STEEP ROCK LAND**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පාංශු ප්‍රභේද වල ව්‍යාප්තියේ විශාලත්වය පහත වගුවේ සදහන් පරිදි දැක්විය හැක.

| පාංශු ප්‍රභේද | ව්‍යාප්තිය ( හෙක්ටයාර්) |
|---|---|
| අපරිනත දුඹුරු ලොම් පස | **2763** |
| රතු දුඹුරු ලැටසොලිත පස | **3706** |
| ප්‍රපාතකාර පාෂාණ බිම් ඇති ප්‍රදේශවල ලිතසොල්ස් පස | **61** |

*<u>දේශගුණය -</u>*

මැදරට නෙන් කළාපීය ප්‍රදේශයක් වන මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වාර්ෂික වර්ෂාපතනය මි.මි.**2500 – 3000** අතර වේ.වාර්ෂිකව මාර්තු,අප්‍රේල්,සැප්තැම්බර්, ඔක්තෝම්බර්යන මාස වලදී සංවහන වර්ෂාවෙන්ද ජුනි මාස වලදී මධ්‍ය කඳුකරයට ලැබෙන නිරිත දිග මෝසම් වර්ෂාවෙන්ද දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා ලැබෙන ඊසාන දිග මෝසම් වර්ෂාවෙන්ද ප්‍රදේශය පෝෂණයවේ.

# *උඩුනුවර යටගියාව හා ඓතිහාසික පසුබිම*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20 අතරින් උඩුනුවරට අනුරාධපුර යුගය දක්වා දිවෙන ලිඛිත ඉතිහාසයක් ඇත.වේගිරි කන්ද ක්‍රි.පූ.තුන් වන ශත වර්ෂයට අයත් බ්‍රාහ්මීය ශිලා ලේඛනවලින් ඒ බව සනාථ වේ.

*“ බත සුමනග තිසහ උපශිත (ගුම) නය උපශිත තිසලය (ශත) (කු) මරස ගපති දූතකස සොණහ දටික සුමන - මණිකර දතෙ මණිකර චූඩෙ ගපතිකෙ”*

යනු එම අභිලේඛණ වේ.මෙම ලේඛණ අනුව ක්‍රිස්තු පූර්ව යුගයේ පවා මෙම ප්‍රදේශය ජනාවාසව පැවති බවට පැහැදිලිය. ඒ යුගයේ මේ පෙදෙස හුදු මලය රට යනුවෙන්ද හැදින්විණි.
පණ්ඩුවාස දේව කුමරුගේ භාර්යාව වන භද්ධකච්චායනාවගේ සහෝදරයෙකු වන සුද්ධෝදන කුමරා ගම්පල උප රාජධානියක් පිහිටුවා ගෙන ඇති අතර ඔහුගේ වාස භූමිය උරුලැවත්ත ප්‍රදේශය විණැයි ද පැවසේ.පණ්ඩුකාභය රජුගේ කාලයේ ලක්දිව ග්‍රාම සීමා පැනවීමේදි මේ පෙදෙස උරුවේලවත්පු යනුවෙන්ද හඳුන්වා ඇතැයි වියතුන් මත දක්වති.

වලගම්බා සමයේ පැවත් දුෂ්කර අවස්ථාවේදි (ක්‍රි.පූ. 80-77) අනුරාධපුරයේ විසූ භික්ෂූන් මලය රට කරා සංක්‍රමණය වූ බවත් එම හිමිවරුන්ගෙන් කීප නමක් වත්ථුල පර්වතයේ විසූ බවත් සද්ධම්මාලාකාරයේ වත්ථුල පර්වතය අනිකක් නොව උඩුනුවර පිහිටි කූරගල කන්ද බවට හඳුනාගෙන ඇත.මෙය වේගිරි කන්දේම දකුණු සීමාවේ පිහිටා ඇත.

- ❖ *<u>උඩුනුවර ව්‍යවහාර කර ඇති පැරණි නාම</u>*

පොලොන්නරුව යුගයේ පණ්ඩිත පරාක්‍රම බාහු රජුගේ පුත් 11 වන විජයබාහු යුව රජතුමා සිදුරුවානේ වල්ගම්පායේ අභවරාජ යන නමින් පිරිවෙනක්ද ඉදි කර ඇති වග පූජාවලියේ සඳහන් වේ.(වල්ගම්පාය අයත් වනුයේ වර්තමාන යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයට බවද මෑත අතීතය තුළ උඩුනුවර හා යටිනුවර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ දෙකම දෙනුවර වශයෙන් හඳුන්වා ඇත.) සින්දූරන් යන ගල් වර්ගය බහුලව තිබුණු පෙදෙස හා කන්ද අයත් කොටස සින්දූරන් කන්ද - සින්දූරම - සිදුරුවානා ලෙස ව්‍යවහාර වූ බව පැවසේ.සින්දූරන් නමැති දියර වර්ගය ගැලූ නිසා හෝ හිගුරු වනයක් තිබුණු නිසා හෝ සිදුරුවානා යන නම භාවිත විණැයි කියවේ.

ඒ අතීතයේ ලක්දිව රුහුණු,පිහිටි,මායා යන ප්‍රධාන කොටස් තුනට බෙදා තිබණු සමයේ මායා රටට අයත් වූ රටවල් 28 න් මුල් තැන සිදුරුවානා රට බව වර්තමාන උඩ පළාත,උඩුනුවර,යටිනුවර යන ප්‍රදේශවලද පැතිර තිබූ වග සඳහන් වේ.

- ❖ *<u>උඩුනුවර යන නාමයේ ආරම්භය</u>*

ගම්පොල රාජධානියේ ප්‍රථම රජු වන IV වැනි බුවනෙක බාහු රජු කාලයට ( ක්‍රි.ව.1341- 47) අයත් ලංකාතිලක ශීලා ලේඛණයේ සිදුරුවානා දෙනුවර , සිදූරුවානා - උඩුනුවර හා යටිනුවර යනුවෙන් සිදුරුවානා රට කොටස්

වලට බෙදී ගිය බවක් සදහන් වේ. මෙම සිදුරුවානා රට දෙකට බෙදීම පිළිබදව ජනප්‍රවාදයන් ඇත. ඒ අනුව සිදුරුවානා නුවර සිටිබණ්ඩාර කෙනෙකු විසින් තම දූවරුන් දෙදෙනාට දෑවැද්ද වශයෙන් සිදුරුවානා රට උඩුනුවර - යටිනුවර යයි කොටස් දෙකකට බෙදා දුන් බවක් කියවේ.මෙයින් පසුව උඩුනුවර - යටිනුවර වන නම භාවිත විය.එය සේනාසම්මත වික්‍රමබාහු රජුගේගල්ගාණේ තුඩපතින් හා කොබ්බෑවල තුඩපතින් ද තව දුරටත් සනාථ වේ.මේ පිළිබදව වෙනත් ලේඛණයක එන සදහනක් මෙසේය.

*“ දිය සිදුරු ඕ ගන් තටාක වැව් පුස්කරනාදියෙන් සමලංක්‍රත වූ හෙයින් සිදුරුවානා රට යැයි පළමු ප්‍රසිද්ධ විය. ඊට පසු අතීතයෙහි මෙහෙණවර තිස්ස නම් රාජෝත්තම කෙනෙක් සින්දූර පර්වතාස්‍රයේ උඩුනුවර කර විසු හෙයින් උඩුනුවර විය”*

උඩුනුවර යන බෙදීම තහවුරු වූ කාලය

කෝට්ටේ යුගයේ සිටම උඩ කට්ටුව කන්ද , උඩ පස්රට යනුවෙන්ද හදුන්වනු ලැබූ කන්ද උඩරට ප්‍රාදේශීය රාජ්‍යයක්ව පැවති බවට ප්‍රකටය. ශ්‍රී වාසපුර, ශ්‍රී වර්ධනපුර,සෙන්කඩගල නුවර වැනි නම්වලින්ද කලින් කල හදුන්වනු ලැබූ මේ උප රාජ්‍ය සෙනරත් රජු විසින් කොටස් තුනකට බෙදා තම පුතුන් තිදෙනාට පවරා දී තිබේ.

ඒ මෙසේය - කුමාරසිංහ කුමාරයාට ඌව ප්‍රදේශය.විජයපාල කුමාරයාට මාතලේ ප්‍රදේශය හා කණිටු පුත් රාජසිංහ කුමාරයාට කන්ද උඩරට පස්රට යනුවෙනි.උඩුනුවර, යටිනුවර,හාරිස්පත්තුව,තුම්පනේ හා හේවාහැට යනු ඒ කන්ද උඩ පස් රට වේ. මේ බෙදීමෙන් පසුව උඩුනුවර වෙනම රටේ මහතෙකු යටතේ පාලනය විය.1954 දක්වාම උඩුනුවර රටේ මහතෙකු යටතේ පාලනය වූ බව පැහැදිලිය.සෙන්කඩගල රාජධානි සමයේ විශේෂ රාජ වරප්‍රසාද ලැබූ බව සදහන් වේ.වෙන පළාත්වලට වඩා උඩුනුවරින් රජ වාසලට ගෙවිය යුතු “කාත්හාල්” ප්‍රමාණය අඩු කිරිම එයින් ප්‍රධාන තැනක් ගනි.මහනුවර රජවන්නා උඩුනුවර වැසියන් විසින් පිළිගන්නෙකු විය යුතුය යන තිරණයක්ද විය.

ඓතිහාසික උරුමයන් ඇති “උපදිසාපති කොට්ටාශ” වර්තමාන ප්‍රාදේහිය ලේකම් කොට්ඨාශ 20න් උඩුනුවරට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

ලෝක පූජිත කැටයම් පිහිටි ඇම්බැක්ක දේවාලයද ගඩලාදෙණිය,ලංකාතිලකය වැනි ඓතිහාසික විහාරස්ථානද උඩුනුවර පිහිටා ඇත.ගම්පල යුගයේදි සේනාධිලංකාර මහ මන්ත්‍රි විසින් මෙම ප්‍රදේශය සමෘද්ධියෙන් උසස් තැනකට පත් කර ඇත.එතුමාගේ වාසභවන වි තිබුණේ උඩුනුවර සින්දූරන්කන්දය.පොලොන්නරු සමයේදි මහා විජයබාහු රජතුමා විසින් රට එක්සේසත් කිරිමේදි සටන් පුහුණු කටයුතු සිදුවුයේද මෙම කොට්ඨාශයේ පවතින ගෝනාධිකවත්තේ කෙලවරය.ගම්පොල රජ බිහිවුයෙත්,කෝට්ටේ රජ පරපුරේ ආරම්භය සිදුවුයේත් උඩුනුවරය.විශේෂයෙන්ම මහනුවර රජ පරපුර ආරම්භ වුයේ උඩුනුවරින් බව කියවේ.

- මහනුවර පළමුවැනි විමලධර්මසුරිය නමින් රජවූ කොනප්පු බණ්ඩාර කුමාරයා උපන් ගම උඩුනුවර උරුලෑවත්තය.

- උඩුනුවර සංදේශ කවියා ජිවත් වුයේ උඩුනුවර තලවතුරේ බව ජනවහරේ පවති.

උඩුනුවර කිරිවවුල හා ගඩලාදෙණිය පිත්තල කර්මාන්තයටත් දියතරිප්පු ඇස් කණ්ණාඩිවලටත් ඉමහත් ප්‍රසිද්ධියක් උසුලයි.මෙසේ අතිතයේ පටන් අද දක්වා ශත වර්ෂ ගණනාවක් තිස්සේ සංස්කෘතික මධ්‍යස්ථානයක් ලෙස සැලකිය හැකි උඩුනුවර සංස්කෘතික ශ්‍රී විභූතිය පෙන්වන කිර්ති ශ්‍රී රාජසිංහ රජු , රාජාධිරාජසිංහ රජු , ගම්පොල i වැනි බුවනෙක බාහු රජු , ගම්පොල iv වැනි බුවනෙක බාහු රජු , ගම්පොල v වැනි බුවනෙක බාහු රජු

, ගම්පොල iii වන වික්‍රමබාහු රජු ආදි රජ්‍ය සමයන්හිදි ඉදිවූ වෙහෙර විහාර රාශියක් උඩුනුවර කොට්ඨාශයේ පිහිටා ඇත.